## කවි කොළය

# නඩේසන්!

පෙරදා මහරගම පොලිසියෙ සිටිය 'නඩේ'
ඇදගෙන සරත් ජයසුන්දර සමග ලෙඩේ
කොටි අඩවියට පැන යන එන අතර කඩේ
විය එහි පොලිස්පති මේකයි පුදුම වැඩේ

දකුණේ සිහළ තරුණියකගෙ රැගෙන අත
ඔබ ඔප කළ ජාතික සමගියෙහි පොත
හැම දෙනෙකුටම දක්වා සිටි සුහද සිත
ඔය කොටි පුල්ලි ඒ දිනවල තිබුණේ නැත

ඇද කුද නැතුව යොදමින් හොඳ වචන ඉතා
ඔබ සිංහලෙන් කළ අන්දම දුටිමි කතා
දැන්වත් පරාජය පිළිගෙන දුරට සිතා
එනු මැන අතැර ඔය මිනිමස් බුදින සතා

ලොක්කා වුනත් අද මොහු පොලිසියෙහි කොටි
පී. සී. කෙනෙකි එදවස මා යටතෙ සිටි
චන්ද්‍රා පොලිස්පති පවසන විටදි මැටි
මෝලෙකු වගේ ඔබ නිහඬව සිටිය හැටි

ගත් පසු තමිල් සෙල්වම් මහ පොළව බදා
ලොක්කා ඔබව ගති නියැදුරුකමට යොදා
ඇන්ටන් බාලසිංහම් දැගලුවද එදා
කෝ ඊළමක් ගත්තද? රට දෙකට බෙදා

සාජන් තිලකරත්නගෙ පත්තර තීරු
අලවන පොතෙහි කොටි හමුදාවෙහි සේරු
සිටියා කිට්ටු ඔබ දෙපසට වී මාරු
මහ කොටියාය මැද සිටියේ තර බාරු


තොරතුරු තවත් එහි විය මහ ඉහළ ගනේ
මම එය තැබිමි පත්තරකාරයෙකු කණේ
ඔබ දන්නෙහිද ඒ පුවතට මොකද වුණේ
සිළුමිණ මගින් හෙළි කෙරුවා ලොවට 'රණේ'

දැන් ඇත සටන එළඹී අවසන් ගැම්මේ
හමුදාවෝ ඇදෙති මුලතිව් වෙත පිම්මේ
අත හැර බේද බැඳෙමින් සොහොයුරු බැම්මේ
රහසකි සිතේ පැවතුණු එළයට දැම්මේ

වලිගය කපා දා
ඔය කොටි හම ගලවා
අවි බිම තබා සාමයෙ
දිය දද ලෙලවා
ආ යුතු වහා යුද
ගිනි ඇතට පලවා
නැතිනම් හොඳයි
ගත්තොත් හඳහන බලවා



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka






තුෂාර චන්දන සහ තාරුකා දිල්හානි

# සිංහල ජෝඩුව තමිල්නාඩුවේ දී හිරබාරයට ගනිති

අංඑත විවාහ වූ සිංහල යුවලක් තමිල්නාඩුවේ රාමනාදපුරම් දිස්ත්‍රික්කයේ ගොඩබැස, ඉන්දියා- වේ දේශපාලන සරණාගත තත් වය ඉල්ලා සිටියත් එහි බලධාරීන් එය ප්‍රතික්ෂේපකර ඇත. ප්‍රශ්න කිරීමේදී ඒ දෙදෙනගේ කට උත්තර එකිනෙකට පරස්පර වීම හා පැවසූ යම් යම් කරුණු සැබෑ බව ඔප්පු නොවීම නිසාත්, ඔවුන් සතුව ගමන් බලපත්‍ර හෝ වෙනත් ආගමන ලියකියවිලි කිසිවක් නොවූ නිසාත් ඉන්දියානු ගමන් බලපත්‍ර රෙගුලාසි යටතේ ඒ අඹු සැමි දෙදෙන වරදකරුවන් බවට බලධාරීන් විසින් තීන්දුකරන ලදී.

දහස් ගණනක් දෙමළ ජනයා උතුරේ සිට තමිල්නාඩුවට රැක වරණ සොයා එද්දී ඔවුන් සරණා ගතයන් ලෙස ඉන්දියානු රජය පිළිගන්නා නමුත් සිංහල යුවලක් සරණාගත තතවය ඉල්ලා ආ ප්‍රථම වතාව මෙය වන අතර ඔවුන්ට එය ලැබුණේ ද නැත.

තුෂාරා චන්දන සහ තාරුකා දිල්හානි නමැති මේ සිංහල යුවල කොළඹ පදිංචිකරුවෝය. ඔවුන් ගේ සම්බන්ධයට ගෙදරින් ඉඩ නොදුන් නිසා පැන ආ බව කියති. ඔවුන් වව්නියාවට විත් තවත් දෙමළ පිරිස් සමග තමිල් නාඩුවට ළඟාවී ඇත.

උසාවියට ඉදිරිපත්කරන ලදුව දෙදෙනාට සිරදඬුවම් නියම කෙරිණ. ඒ පැන ආ කතාව උසාවිය විස්වාස කළේ නැත. 30 වියැති තුෂාර, මදුරෙයි හිරගෙදරට ද, 18 වියැති තාරුකා, ළමා පරිවාස භාරයට ද යැවීම සඳහා පොලීසි යට භාර දෙන ලදී.

## කොළඹ විත්ති




**International Scools යන සිසුන්ගේ අම්මිලා සඳහා දැන් Spoken English පංති**

ඉංග්‍රීසි ඉගෙන ගැනීම දැන් මුළු රටේම උන්මාදයක් පිස්සුවක් වීගෙන යද්දී එය ප්‍රයෝජනයට ගැනීමට ටියුෂන් මාස්ටර්ලා යුහුසුළු වී ඇත. දැන් ඉංග්‍රීසි උගන්වන්නේ ළමයින්ට නොව ඉන්ටර් නැෂනල් පාසැල් වලට යවන ළමයින්ගේ අම්මලාට නොහොත් අම්මිලාටය. එයට හේතුව මෙයයි. ඉන්ටර්නැෂනල් ළමයි ඉස්කෝලෙ යන්න හිටියට පස්සෙ ගෙදර අය එක්කවත් සිංහලෙන් කතාකරන්නේ නැත. ඒ කියන දෙය අම්මලාට තේරෙන්නේ නැත. ඒ නිසා අම්මිලා දැන් ඉංග්‍රීසි ඉගෙනගනිති

ඉහත දැක්වෙන්නේ අම්මිලාට ඉංග්‍රීසි උගන්වන පංති තිබෙන බව කියන්නට නුගේගොඩ ගසා ඇති පෝස්ටරයකි අහෝ ශ්‍රී ලංකාදීපයට ගිය කල ! අනේ කාලේ වනේ වාසේ !



**ඉරිදා** - **SUN** රංජනී පෙරේදා සවුත්හෝල් යන ගමන් අපේ දිහා ආවා. උපුල් නිසා ඇති වෙච්ච ප්‍රශ්නයක් කියන්නයි ආවෙ. ඒ කියපු දේවල් මම මෙතන ලියන එක හරිනෑ. එතකොට කවුරුත් දැනගනීවි. රන්ජනී මට ඒ දේවල් කිව්වෙ කටේ කෙල බිම හලන්න එපා කියලා. මට කවුරු හරි රහසක් හරි පුද්ගලික දෙයක් කිව්වොත් මම ඒක රකිනවා. ගඟේ මූදෙ දැම්ම වගේතමයි. කාගෙ වත් කනට යන්නෙනෑ. ආපහු යන්න නැගිටලා රන්ජනී මෙහෙම දෙයක් කිව්වා. අනේ ඇත්තට ජීවිතේ ටෙලි නාට්‍යයක් වෙනව නම් කියලා. මං ඇහුවා ඊස්ට් එන්ඩර්ස් වගේ එකක්ද කියලා. අපෝ නෑ....මං කිව්වෙ ලංකාවෙ ටෙලිනාට්‍ය ගැන කියලා රංජනී කිව්වා. මට ඇත්තට ඒක තේරුණේ නෑ.....හෙට අහන්න ඕන....

**සඳුදා** - **MON** ලංකාවෙ ප්‍රශ්නෙට අත දාන්න කියලා තමිල් නාඩුව ඉන්දියන් ආණ්ඩුවට අච්චර කියලත් වැඩක් වුණේ නැති නිසා තමිල් නාඩුවෙ චෙන්නායිවල කෝවිල කට එහේ දෙමළ මන්තර ගුරුකම් කාරයො දොළොස් දෙනෙක් එකතුවෙලා දැන් පුරා මාසයක් තිස්සෙ ජීවම් කරලා බලගතු සූරයක් හදල තියනවලු ප්‍රභාකරන්ට එවන්න. එහේ මැඩ්රාස්වල ගහන තෙළිඟු නිවුස් කියන පත්තරේ තිබිලා තියනවා. ඒ සූරේ කරේ දැම්මම කාල තුවක්කු පාරවල් නෙවෙයි මිසයිල් ගැහුවත් වදින්නෙ නැතිලු. ඉතින් ඒ සූරේ මුලතිව්වලට එවාගන්න විදියක් නැතුවලු ඉන්නෙ. ඒක බෙල්ලෙ බැඳගත්ත නම් ප්‍රභා මොන හමුදාවටවත් අල්ලන්න බැරිය කියලා කරුණා- නිධිත් කිව්වලු. අර සයනයිඩ් යන්තරේ පිහිට තමයි දැන්.

**කුජදා** - **TUE** අද ලංකාවෙ ටෙලි නාට්‍යයක් බලද්දියි පෙරෙයිදා රන්ජනී කියපු දේ මට තේරුණේ. ඇත්ත තමයි ජීවිතේ ලංකාවෙ ටෙලි නාට්‍යයක් වගේ නම් කොච්චර හොඳද? ඒ ටෙලි නාට්‍යයෙ හැටියට ඉන්ටර්වීව් එකකට ගිය ගමන් සුදුසු කම් තිබුණත් නැතත් ආයතනයේ බොස්ට හිත ගිහිං රස්සාවට ගන්නවා. ගෙදර ටොයිලට් එකට යන්නෙත් පුල්සූට් ගහගෙන. උපන්දිනේට තාත්තා දුවට තෑගි දෙන්නෙ කාර් එකක්. කවදාවත් ඩ්‍රයිවිං ඉගෙන ගත්තෙ නැති ඒ දුවට පුළුවන් කාර් එකට නැග්ග ගමන් ඒක එළවගෙන යන්න. ඇත පළාතක ගිහිං කාර් එක කැඩිලා පාළු පාරක අතරමං වෙලා ඉන්න කොට හරියටම ඒ වෙලාවට එතනින් ඉස්සර පන්තියෙ පරණ යාළුවෙක් යනවා. පවුලෙ ලොකු පුතා තරහවෙලා යන්නෙ එංගලන්තෙ. වීසා ගන්නෙත් නැතුව ගිහිං කෙලින්ම ප්ලේන් එකට නගිනව. ෂහ්..... ලංකාවෙ මරු ජීවිතේ.....ලංකාව පාරාදීසයක් කියන එක ඇත්ත

**බුදදා-** **WED** ලංකාවෙ පත්තරේක තිබුණා ගිය සුමානෙ ටෙලි පෝන් එකෙන් ප්‍රභාකරන් එක්ක කරපු සාකච්ඡාවක් ඒකෙ ප්‍රභාකරන් කියනවා අපිව පරාජය කරන්න හම්බ වෙන්නෙ නැහැ. අපේ හමුදාව ඔය කියන විදියට අඩ පණවෙලා නැහැ. මුළු ජාත්‍යන්තර ප්‍රජාව ඉන්නෙ අපිත් එක්ක. කවුද කියන්නෙ අපි අසරණ වෙලා කියලා. ඔය සිංහළ හමුදාව ගහන පච ප්‍රචාර. ඔන්න බලන්න අපි අපේ දෙමළ ඊළම මාර්තු වෙනකොට පිහිටවනවා..... ඉතින් මේ විස්තරේ කියවලා අපේ ආතර් මාමා කිව්වා, මේ ඒ වේළුපිල්ලෙ ප්‍රභාකරන් වෙන්න බෑ.... උංට මේ වෙලාවෙ ඉන්ටර්වීව් දෙන්න තියා වැසිකිලියෙන් එළියට එන්න බැරුව පොළව යට ගුල ඇතුලෙ ඉන්නෙ...අනික් කාරණේ...තවම මුලතිව් කැලෑවට ටෙලිපෝන් තියනවද? මේ ප්‍රභාකරන් පිටකොටුවෙ මාර්කට් එකේ නාට්ටාමි කෙනෙක් වෙන්න ඇති..... මේ පත්තරේ විකුණගන්න කරපු ප්‍රෝඩාවක් කියලා. ඇත්ත තමයි ඒ කතාව.

**ගුරුදා-** **THU** තිලකයි එයාගෙ මහත්තෙයයි දෙන්නා ගිය මාසෙ දඹදිව ගියා. ලන්ඩන්වලින් යන හොඳ නඩයක් එක්ක යන්න කියලා අපි කිව්වට ඇහුවෙ නැහැ. අපෝ ඊට වඩා ලාබෙට යන්න ක්‍රම තියනවා කියලා ලංකාවට ගිහිං, කවුද කට්ටියකට එකතු වුනාලු. ගිය සතියෙ ආපහු ලන්ඩන් ආවම තමයි විස්තරේ කිව්වෙ. හෝටල්වල නෙවෙයි ඉදලා තියෙන්නෙ, මදුරුවො කකා විශ්‍රාම ශාලාවල. හට්ටි වළං එහෙන් හොයාගෙන, සියඹලාගස් යටලු බත් ඉව්වෙ. ටොයිලට් පහසුකම් තිබුණේ කැලෑ වෙලු. තිලකගෙ මූණ මදුරුවො කාලා තවම තඩිස්සි වෙලා. ලාබෙ බලාගෙන ගිහිං පුදුම දුකක් වින්දයි කිව්වා. එයාගෙ හිතහැදෙන්න මං මෙහෙම කිව්වා. ඔය මාසයක් දුක් විඳලා නේ. එතකොට බුදු හාමුදුරුවො හය අවුරුද්දක් දුෂ්කරක්‍රියා කළේ? ඒක කොච්චර අමාරු ඇද්ද? එහෙම කිව්වම තිලකට මංහිතන්නෙ තරහ ගියා.

**කිවිදා -** **FRI** ප්‍රභාකරන් අහුවුනොත් අනේ අපිට බාර දෙන්න කියලා ඉන්දියාව අපේ විදේශ ඇමතිට කිව්වලු. ඇමතිත් කිව්වලු බලමු කියලා. මම ඇමතිනම් අහනවා මෙහෙම. අපි දුන්නම තමුසෙලා එයාට මොකද කරන්නෙ? හිරේ දානවද? මරණවද? නැත්නම් මූණ ඉඹිනවද? උංට තමිල් නාඩුව බාර දෙනවද එහේ ඊළමක් හදාගන්න? එහෙම නැත්නම් කුඹුරු හාන්න විය ගහේ බඳිනවද? අපි මේ උං අල්ලන්න මහන්සිවෙන්නෙ තමුසෙලාට දෙන්නද? මොනවද මේ දොඩන්නෙ? තනිකරම කුණුහරුප නේද?